මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය
நிதி, பொருளாதார அபிவிருத்தி, கொள்கை வகுத்தல், திட்டமிடல் மற்றும் சுற்றுலாத்துறை அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC DEVELOPMENT, POLICY FORMULATION, PLANNING AND TOURISM

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: DMA/PROJECTS/2024 – GUIDELINES
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2024.10.24

කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක: **DMA/02/2024**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

දිස්ත්‍රික් ලේකම්වරුන්

රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල / රජය සතු ව්‍යාපාරවල ප්‍රධානීන්

<u>ව්‍යාපෘති කළමනාකරණ මාර්ගෝපදේශය</u>

ආර්ථික වර්ධනය ළඟා කර ගැනීම, පාරිසරික සමතුලිතතාව රැක ගැනීම, ආගමික සහ සාමාජීය සහජීවනය වැඩි දියුණු කර ගැනීම වැනි අරමුණු ඇතිව පසුගිය දශක කිහිපය තුළ බලයට පත්වූ විවිධ රජයන් දේශීය හා විදේශීය මූල්‍ය දායකත්වයෙන් ශ්‍රී ලංකාව තුළ විවිධ වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. එම සංවර්ධන ව්‍යාපෘතිවල සාර්ථක අසාර්ථකභාවය පිළිබඳ නැවත සමාලෝචනය කිරීමේ දී ඇතැම් ව්‍යාපෘති තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා තිබුණ ද බොහොමයක් ව්‍යාපෘති තුළින් වැය කළ අරමුදල්වලට සාපේක්ෂව අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොමැති බව නිරීක්ෂණය වේ.

2. ව්‍යාපෘතිවල සාර්ථක අසාර්ථකභාවය තීරණය වීම කෙරෙහි බලපාන ප්‍රධාන සංරචකයන් වශයෙන් ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම, යෝජනා ඇගයීම හා අනුමත කර ගැනීම, අධීක්ෂණය හා ප්‍රගතිය ඇගයීම, හවුල්කරුවන්ගේ සම්බන්ධතාව, කණ්ඩායම් දක්ෂතා හා අභිප්‍රේරණය, භාවිත කරනු ලබන තාක්ෂණය, මූල්‍ය හා අනෙකුත් සම්පත් කළමනාකරණය යනාදිය හැඳින්විය හැකි ය.

3. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් සංවර්ධන ව්‍යාපෘතීන්ට අදාළ විගණන හා කළමනාකරණ කමිටුවලට සම්බන්ධ වීමේ දී ව්‍යාපෘති අසාර්ථක වීම සඳහා හඳුනාගත් එක් ප්‍රධාන හේතුවක් වශයෙන් ව්‍යාපෘති සැලසුම් කිරීම, ඇගයීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා ව්‍යාපෘති අවසන් කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයකට භාර දීම දක්වා වූ සමස්ත ව්‍යාපෘති ක්‍රියාදාමය සම්බන්ධයෙන් නිශ්චිත මාර්ගෝපදේශයක් නොමැති වීම දැක්විය හැකි ය. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළව මහා භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සහ ඇතැම් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් විවිධ අවස්ථාවල චක්‍රලේඛ හා උපදෙස් ලබා දී තිබුණ ද සම්පූර්ණ හා සියලු අංශයන් ඒකාබද්ධ වූ එක් මාර්ගෝපදේශයක් නොතිබුණි.

4. ඒ අනුව, මෙම අඩුපාඩු මගහරවා ගැනීම සඳහා භාණ්ඩාගාරයේ විවිධ දෙපාර්තමේන්තු විසින් තම විෂයපථයට අදාළව කලින් කළට නිකුත් කර ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ චක්‍රලේඛ සියල්ල සැළකිල්ලට ගෙන කාලීන අවශ්‍යතාවයන් ද සපුරාලන පරිදි එකී දෙපාර්තමේන්තුවල ද එකඟතාවය මත කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් මෙම ව්‍යාපෘති කළමනාකරණ මාර්ගෝපදේශය පිළියෙල කර ඇත.

5. මෙම මාර්ගෝපදේශය ප්‍රධාන අංශ කිහිපයක් යටතේ අදාළ පියවරයන් පෙළ ගස්වා ඇත. එනම්;

i. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ විධිවිධාන හා ආයතනික සැකැස්ම
ii. ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම, යෝජනා ඇගයීම හා අනුමත කරවා ගැනීම, අධීක්ෂණය සහ ප්‍රගතිය ඇගයීම
iii. ව්‍යාපෘති සඳහා ඉඩම් පවරා ගැනීම හා නැවත පදිංචි කිරීම
iv. ව්‍යාපෘති අධ්‍යක්ෂගේ සහ ව්‍යාපෘතියෙහි ප්‍රධාන අංශයන්හි වගකීම් හා කාර්යභාරය
v. ව්‍යාපෘති නිම කිරීම හා වත්කම් පැවරීම
vi. ව්‍යාපෘති අභ්‍යන්තර විගණනය

6. ඒ අනුව, මෙම ව්‍යාපෘති කළමනාකරණ මාර්ගෝපදේශය මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විස්තරාත්මක මගපෙන්වීමක් ලබා දෙන බැවින් ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත් සභාව හෝ ව්‍යවස්ථාපිත ආයතනය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා මෙම මාර්ගෝපදේශයේ ඇතුළත් ප්‍රතිපාදනවලට අනුගතවීමේ අවශ්‍යතාවය අවධාරණය කරන අතර, විශේෂයෙන් ව්‍යාපෘතිවල අභ්‍යන්තර විගණකවරුන්හට ආයතනයේ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය වැඩිදියුණු කර ගැනීම සඳහා මෙම මාර්ගෝපදේශය පිළිපැදීම අනිවාර්ය්‍ය වේ.

7. මෙම මාර්ගෝපදේශයේ ඇතුලත් යම් කරුණක් සම්බන්ධයෙන් අමතර පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම්, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ දුරකථන අංක 011-2484543 මගින් හෝ dgma@dma.treasury.gov.lk විද්‍යුත් ලිපිනයට යොමු කිරීමෙන් ලබා ගත හැකි ය.

ඒ.කේ.සෙනෙවිරත්න
ලේකම් (වැ.බ.)

පිටපත් : 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. විගණකාධිපති
05. ලේකම්, මුදල් කොමිෂන් සභාව

**කළමනාකරණ විගණන මාර්ගෝපදේශ 02/2024**

**<u>ව්‍යාපෘති කළමනාකරණ මාර්ගෝපදේශය</u>**

ආර්ථික, සාමාජීය හා මූල්‍ය ප්‍රතිලාභ ලබා ගැනීමේ අරමුණින් දේශීය හා විදේශීය අරමුදල් භාවිත කර ආරම්භ කරන ලද බොහොමයක් සංවර්ධන ව්‍යාපෘති තුළින් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබීම හෝ එම ප්‍රතිඵල සැලසුම් කළ කාලපරිච්ඡේදය තුළ ලබා ගැනීමට නොහැකිවීම රට මුහුණ දුන් ආර්ථික අර්බුදයට බල පෑ එක් ප්‍රධාන කරුණක් ලෙස සැලකිය හැකි ය.

පසුගිය කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතිවල අසාර්ථකත්වයට බල පෑ කරුණු විශ්ලේශණය කිරීමේ දී ඇතැම් ව්‍යාපෘති එම ව්‍යාපෘතියටම ආවේණික හේතූන් මත අසාර්ථක වී ඇති අතර බහුතරයක් ව්‍යාපෘති අසාර්ථකවීම සඳහා ආර්ථික, දේශපාලනමය, සාමාජීය හා පරිපාලනමය කරුණු හේතු වී ඇත. ඒ අනුව, පොදුවේ සංවර්ධන ව්‍යාපෘති අසාර්ථකවීමට හෝ අපේක්ෂිත ප්‍රතිඵල ඒ ආකාරයෙන්ම නොලැබීම සඳහා ඍජුව හෝ වක්‍රව පහත හේතූන් බලපා ඇති බව නිරීක්ෂණය වේ. එනම්;

1. ව්‍යාපෘති හඳුනාගැනීමේ හා සැලසුම්කරණයේ දුර්වලතා

   ව්‍යාපෘති අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගැනීමත්, ජාත්‍යන්තර, ජාතික හා ආංශික ප්‍රතිපත්ති, ඉලක්ක හා සම්මුතීන්ට අනුගත නොවීමත්, ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික තත්ත්වයන්ට සාපේක්ෂව අධි තාක්ෂණික හා ඉතා ඉහළ පිරිවැයක් සහිත ව්‍යාපෘති තෝරා ගැනීමත් ඇතුළු සැලසුම්කරණයේ දුර්වලතා හේතුවෙන් අපේක්ෂිත අරමුණු හා ප්‍රතිඵල ළඟා කර ගැනීමට නොහැකි වීම.

2. ව්‍යාපෘති යෙදවුම් දාමය අඛණ්ඩව පවත්වා ගැනීමට නොහැකි වීම.

   ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමෙන් අනතුරුව පැන නගින අනපේක්ෂිත අර්බුදකාරී තත්ත්වයන් හේතුවෙන් අරමුදල්, මානව සම්පත් හා තාක්ෂණය සීමිත වීම තුළ අපේක්ෂිත පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම. මේ හේතුවෙන් ව්‍යාපෘතියේ ගුණාත්මකභාවය අඩු වීම, ව්‍යාපෘතියේ විෂයපථය සීමාවීම හා /හෝ සම්පූර්ණ කිරීමේ කාලය දීර්ඝ වීම සිදුවීම.

3. වගවීමේ හා කළමනාකරණයේ දුර්වලතා

   ව්‍යාපෘතිය වෙනුවෙන් වෙන් කළ සම්පත් වෙනත් අරමුණු වෙනුවෙන් යොදා ගැනීම මගින් ව්‍යාපෘතියේ අපේක්ෂිත වියදම ඉහළ යාම, නිශ්චිත කාලපරිච්ඡේදය තුළ නිම කිරීමට නොහැකිවීම හෝ ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබීම සිදු විය හැකි ය.

4. ප්‍රතිපත්තිමය අස්ථාවරත්වය

   නිරන්තරයෙන් සිදු වන ප්‍රතිපත්තිමය වෙනස්වීම් හේතුවෙන් ව්‍යාපෘති කටයුතු අඛණ්ඩව කර ගෙන යාම සඳහා අහිතකර බලපෑම් ඇති විය හැකි ය. මෙහි දී ව්‍යාපෘති අතරමග නැවැත්වීම හෝ ව්‍යාපෘතිය අඛණ්ඩව සාර්ථකව කර ගෙන යාමට අවශ්‍ය සහයෝගය ලබා නොදීම සිදු විය හැකි ය.

5. සම්බන්ධිත පාර්ශ්වයන්ගේ අඩු දායකත්වය

   ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී එම ව්‍යාපෘති මගින් සෘජුව ප්‍රතිලාභ ලැබෙන පාර්ශ්වයන්ගේ සහයෝගය හා අදහස් එම ව්‍යාපෘතියේ සාර්ථකත්වය සඳහා දැඩිව බලපාන බැවින් එම පාර්ශ්වයන් සම්බන්ධ කර නොගැනීම මගින් ව්‍යාපෘතිය කෙරෙහි විරුද්ධ ආකල්පයන් දැරීම හෝ ව්‍යාපෘතියේ සාර්ථකත්වයට අහිතකර බලපෑමක් ඇති වීම.

6. ප්‍රමාණවත් අධීක්ෂණයක් හා ඇගයීමක් සිදු නොවීම.

   නිරන්තර අධීක්ෂණයක් හෝ ඇගයීමක් සඳහා විධිමත් ක්‍රමවේදයක් නොමැතිවීමෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී පැන නගින ගැටලු හා ප්‍රශ්න හඳුනා ගැනීම හා ඒ සඳහා නියමිත කාලයේ දී අවශ්‍ය විසඳුම් ලබා දීමට අපොහොසත් වීම.

7. පාරිසරික හා සාමාජීය බලපෑම් සැලකිල්ලට නොගැනීම.

   නිසි පරිසර අධ්‍යයනයක් සිදු නොකිරීම, සාමාජීය බලපෑම නිසි ලෙස අධ්‍යයනය නොකිරීම වැනි හේතු මත ව්‍යාපෘතිය කර ගෙන යාමේ දී නීතිමය බාධාවන් හෝ බලපෑමට ලක්වන සමාජ ස්ථරයන් හි විරෝධතාවයන් ඇති විය හැකි ය.

8. තාක්ෂණික බාධාවන් හා වෙනස්වීම්

   ව්‍යාපෘතිය කර ගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් තාක්ෂණික දැනුමක් නොමැතිව ව්‍යාපෘතිය ආරම්භ කිරිම මත හා කාලයත් සමඟ සිදුවන තාක්ෂණික වෙනස්වීම් ව්‍යාපෘතිවලට ගැලපීම් නොකිරීම මත ව්‍යාපෘති අසාර්ථක වීම.

9. බාහිර බලපෑම්

   ස්වභාවික ව්‍යසනයන්, ගෝලීය වෙළෙඳපොළ තුළ ඉදිකිරීම් සඳහා යොදා ගැනෙන අමුද්‍රව්‍ය හා යන්ත්‍ර හා උපකරණ මිළ උච්ඡාවචනයන්, ආර්ථික කඩා වැටීම් හා අනෙකුත් බාහිර බලපෑම් ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය සඳහා සෘජුව බලපායි. මෙවැනි හේතූන් ව්‍යාපෘති පාලනයෙන් බැහැර වුව ද එමගින් ව්‍යාපෘතියේ සාර්ථකත්වය හා කාලවකවානු සඳහා සැලකිය යුතු බලපෑමක් සිදු කරනු ලැබිය හැකි ය.

10. ප්‍රමාණවත් අවදානම් කළමනාකරණයක් නොමැතිවීම

   ව්‍යාපෘතියේ දැක්ම, මෙහෙවර හා අරමුණුවලට අදාළව පැනනැගිය හැකි අවදානම් ව්‍යාපෘතිය සැලසුම් කිරීමේදී ම හඳුනා නොගැනීම සහ අවදානම් ඇති වූ විට ඒ සඳහා පූර්ව සැලසුම් කළ විසඳුම් නොමැතිවීම හේතුවෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබීම හෝ සැලසුම් කළ කාලපරිච්ඡේදය තුළ ළඟා කර ගැනීමට නොහැකි වීම.

ඒ අනුව, ඉහතින් දැක් වූ හේතූන් සිදුවීම අවම කර ගනිමින් සංවර්ධන ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘතිවලට සම්බන්ධ රාජ්‍ය අංශයේ ආයතන, සංවර්ධන පාර්ශ්වකරුවන් හා ව්‍යාපෘතියට සම්බන්ධ අනෙකුත් පාර්ශ්වකරුවන් අතර සාමූහික එකඟතාවයක් හා සහයෝගයක් පවත්වා ගැනීම අත්‍යාවශ්‍ය වේ. මේ සඳහා සංවර්ධන ව්‍යාපෘති කර ගෙන යාමේ දී අවශ්‍ය මගපෙන්වීම් ලබා දීම සඳහා විවිධ රාජ්‍ය ආයතන විසින් කලින් කලට චක්‍රලේඛ හා මාර්ගෝපදේශ නිකුත් කර ඇත. ඒ අනුව, එම චක්‍රලේඛ

හා මාර්ගෝපදේශවලින් ආවරණය වන කරුණු සහ වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි ව්‍යාපෘති පරිපාලනය සඳහා අවශ්‍ය අභ්‍යන්තර පාලනයන් ද ඇතුළත් කර විස්තරාත්මක මගපෙන්වීමක් මෙම මාර්ගෝපදේශය මගින් ඉදිරිපත් කර ඇත.

මෙම මාර්ගෝපදේශයේ අන්තර්ගතය පහත පරිදි වේ.


**1. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ විධිවිධාන සහ ආයතනික සැකැස්ම**

1.1. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ විධිවිධාන

1.2. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ ආයතනික සැකැස්ම

1.2.1. විධායක නියෝජිත ආයතනය (Executing Agency) සහ ක්‍රියාත්මක කරන ආයතනයෙහි (Implementing Agency) වගකීම හා කාර්යභාරය

1.2.1.1. විධායක නියෝජිත ආයතනයේ (Executing Agency) වගකීම හා කාර්යභාරය

1.2.1.2. ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතනයේ (Implementing Agency) වගකීම හා කාර්යභාරය

2. ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම, යෝජනා ඇගයීම හා අනුමත කර ගැනීම, අධීක්ෂණය සහ ප්‍රගතිය ඇගයීම (Project Identification, Planning, Appraisal & Approval, Monitoring and Evaluation )

3. ව්‍යාපෘති සහ නැවත පදිංචි කිරීම් සඳහා ඉඩම් පවරා ගැනීම

**4. ව්‍යාපෘති අධ්‍යක්ෂගේ සහ ව්‍යාපෘතියෙහි ප්‍රධාන අංශයන් හි වගකීම සහ කාර්යභාරය**

4.1. ව්‍යාපෘති අධ්‍යක්ෂගේ වගකීම හා කාර්යභාරය

4.2. ව්‍යාපෘති පරිපාලනය

4.3. තාක්ෂණික/ඉංජිනේරුමය කටයුතු

4.4. ප්‍රසම්පාදන කටයුතු

5. ව්‍යාපෘති නිම කිරීම හා වත්කම් පැවරීම

6. ව්‍යාපෘති අභ්‍යන්තර විගණනය

7. අදාළ චක්‍රලේඛ හා මාර්ගෝපදේශ


## 1. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ විධිවිධාන සහ ආයතනික සැකැස්ම

### 1.1. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ විධිවිධාන

මුදල් රෙගුලාසි (මු.රෙ.) 3 අනුව වියදම් සැලසුම් කිරීම යටතේ ව්‍යාපෘති සැලසුම් කිරීමත්, මු.රෙ. 4 යටතේ වියදම් වැඩසටහන්ගත කිරීමත් (Programming of Expenditure) මූලිකවම සිදු වේ. අදාළ විධායක නියෝජිත ආයතනය (බොහෝ විට ව්‍යාපෘතිය අයත් රේඛීය අමාත්‍යාංශය) සහ ක්‍රියාත්මක කරන ආයතනය විසින් (බොහෝ විට අදාළ දෙපාර්තමේන්තුව හෝ ව්‍යවස්ථාපිත ආයතනය) උක්ත විධිවිධාන හා මෙම මාර්ගෝපදේශයේ දක්වා ඇති චක්‍රලේඛ හා විධිවිධාන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී අදාළ  කරගත යුතු ය.

## 1.2. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ ආයතනික සැකැස්ම

ප්‍රාග්ධනගත ව්‍යාපෘතිවල ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීම සම්බන්ධයෙන් ව්‍යාපෘති හඳුනාගැනීම, සැලසුම්කරණය, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය, ඇගයීම, පසුවිපරම සහ වාර්තාකරණය විධායක නියෝජිත ආයතන, ක්‍රියාත්මක කරන ආයතන සහ අනෙකුත් සම්බන්ධිත ආයතන හරහා මහා භාණ්ඩාගාරයේ අදාළ දෙපාර්තමේන්තුවල අධීක්ෂණය යටතේ සිදු කරනු ලැබේ. එමෙන්ම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලැබී ඇති ව්‍යවස්ථාපිත බලතල හා 2018 අංක 19 දරන ජාතික විගණන පනත යටතේ පැවරී ඇති බලතල අනුව විගණන කටයුතු සිදු කර අවශ්‍ය වාර්තා අදාළ ආයතනවලට හා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ජාතික විගණන කාර්යාලය විසින් සිදු කිරීම පවතින ක්‍රමවේදයයි.

### 1.2.1. විධායක නියෝජිත ආයතනය (Executing Agency) සහ ක්‍රියාත්මක කරන ආයතනයෙහි (Implementing Agency) වගකීම හා කාර්යභාරය

සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා මු.රෙ 3 සහ මු.රෙ 4 ප්‍රකාරව ව්‍යාපෘති සැලසුම්කරණය හා වියදම් වැඩසටහන්ගත කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සහ අනෙකුත් මූලික කාර්යයන් ඉටු කිරීම විධායක නියෝජිත ආයතනය හා ක්‍රියාත්මක කරන ආයතනයේ ප්‍රධාන කාර්යභාරය වේ. මෙම ක්‍රියාවලියේ දී පැවරී ඇති වගකීම හා ඉටු කළ යුතු කාර්යයන් විධායක නියෝජිත ආයතනය හා ක්‍රියාත්මක කරන ආයතනය පැහැදිලිව හඳුනා ගත යුතු වේ. ඇතැම් අවස්ථාවන්හි දී ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් විධායක නියෝජිත ආයතනය සහ ක්‍රියාත්මක කරන ආයතනය ලෙස එකම ආයතනයක් කටයුතු කරනු ලබයි.

#### 1.2.1.1. විධායක නියෝජිත ආයතනයේ (Executing Agency) වගකීම හා කාර්යභාරය

- ජාතික ප්‍රතිපත්තිය මත පදනම් වූ ආංශික සැලසුම් රාමුවට අනුව ප්‍රමුඛතා පදනමින් ව්‍යාපෘති හඳුනා ගැනීම හා ඊට අදාළ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීම.
- යෝජිත ව්‍යාපෘතියේ ව්‍යාපෘති වටිනාකමට අදාළව ''රාජ්‍ය ආයෝජන සඳහා සංවර්ධන ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සඳහා මාර්ගෝපදේශ'' යන මැයෙන් ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් 2019.01.10 දිනැතිව නිකුත් කර ඇති අංක MNPEA 02/2019 චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘති යෝජනාව සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහ එහි සඳහන් පරිදි අදාළ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම. ඊට අමතරව ව්‍යාපෘති යෝජනාවේ ස්වභාවය අනුව අදාළ අනෙකුත් ආයතන, එනම් පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වැනි අදාළ ආයතනවලින් පූර්ව අනුමැතිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර ලබා ගැනීම.
- විධිමත් අනුමැතීන් ලබා ගත් පසු අදාළ ව්‍යාපෘති අයවැය ඇස්තමේන්තු තුළට ඇතුළත් කර ගැනීමට අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා කටයුතු කළ යුතු ය. එහි දී විදේශ ණය / ප්‍රදාන මගින් මූල්‍යායනය කරන ව්‍යාපෘතියක් නම් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විමසා එම ණය/ආධාර

ලබා ගත හැකි කාලසීමාව තහවුරු කර ගත යුතු ය. එසේම දේශීය අරමුදල් යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන්නේ නම් පවතින මූල්‍ය අවකාශය තුළ ව්‍යාපෘති වියදම් කළමනාකරණය කර ගත හැකි ආකාරය ජාතික අයවැය දෙපාර්තමේන්තුව සමග එකඟතාවයකට පැමිණිය යුතු ය.එමෙන්ම අයවැය ඇස්තමේන්තුවට ව්‍යාපෘතියක් ඇතුළත් කිරීමේ දී අයවැය සකස් කිරීමට අදාළ අයවැය කැඳවීමේ චක්‍රලේඛයේ  උපදෙස් ද අනුගමනය කළ යුතු ය.

- මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ අංක MOFE&PD/ERD/2020/1 හා 2020.02.12 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම හා එහි දී හඳුනා ගනු ලබන ගැටලු නිරවුල් කිරීම සඳහා අවශ්‍ය තීරණ ගැනීම.
- ව්‍යාපෘති මට්ටමින් විසඳා ගත නොහැකි ගැටලු ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව වෙත ඉදිරිපත් කොට විසඳුම් ලබා දීම සහ එමගින් විසඳුම් ලබා දීමට නොහැකි අවස්ථාවල දී අදාළ ඉහළ අධිකාරීත්වයට යොමු කොට විසඳුම් ලබා ගැනීම.
- ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් ව්‍යාපෘති සම්බන්ධයෙන් වාර්ෂිකව ව්‍යාපෘති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් දෙකක් පැවැත්වීම. (කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ ප්‍රකාරව)
- ව්‍යාපෘති හඳුනා ගනු ලබන අවස්ථාවේ දීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරීගේ ප්‍රධානත්වයෙන් එම ව්‍යාපෘතීන්ට අදාළව අවදානම් කළමනාකරණ කමිටු පිහිටුවිය යුතු ය. එම කමිටුව මගින් ව්‍යාපෘති සැලැස්ම අධ්‍යයනය කර අවදානම් කළමනාකරණ රාමුවක් සකස් කළ යුතු අතර, ඒ යටතේ ව්‍යාපෘතියට අදාළ කාර්යයන් සම්බන්ධයෙන් වන අවදානම, එකී අවදානමේ බලපෑම නිවැරදි කිරීමේ හා අවදානම් අවම කිරීම සඳහා වන අභ්‍යන්තර පාලන ක්‍රම ඇතුළත් වැඩපිළිවෙලක් සකසා ගත යුතු ය. මේ සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති අංක 1/2024 හා 2024.06.21 දිනැති අවදානම් කළමනාකරණ රාමුවට අදාළ චක්‍රලේඛයේ විධිවිධාන අනුගමනය කළ හැකි ය. අවදානම් කළමනාකරණ කමිටුව මගින් හඳුනාගනු ලබන/නිර්දේශ කරනු ලබන යෝජනා ව්‍යාපෘති මෙහෙයුම් කමිටු හා ව්‍යාපෘති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වල දී වැඩිදුරටත් සාකච්ඡාවලට බඳුන් කර අවශ්‍ය තීරණවලට එළඹිය යුතු ය.
- ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කාර්යයන් ඉටු කිරීම හා භාණ්ඩ හා සේවා සැපයීමට අය වැය ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමට පෙර අවශ්‍ය මූලික කාර්යයන් (ඉඩම් අත් කර ගැනීම සහ පොදු පහසුකම්, මෙවලම් හා උපාංග ප්‍රතිස්ථාපනය) හා අත්‍යවශ්‍ය අනුමැතීන් හා නීතිමය ප්‍රතිපාදන ලබා ගෙන තිබේ ද යන්න තහවුරු කර ගැනීම.
- ක්‍රියාත්මක කිරීමේ ආයතනය විධායක නියෝජිත ආයතනය වන විට දී ක්‍රියාත්මක කරන ආයතනයේ වගකීම ඉටු කිරීම.
- පූර්ව ප්‍රසම්පාදන කටයුතු සිදු කළ හැකි අවස්ථාවල දී ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු නියමිත කාලරාමුව තුළ සිදු කිරීම.
- 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනතේ සහ අනෙකුත් නීතිමය විධිවිධාන අනුව ව්‍යාපෘතියේ සැලසුම් අදියරේ සිට ව්‍යාපෘතිය අවසන් කර විධිමත්ව භාර දෙන

අවස්ථාව දක්වා අදාළ සියලුම ගිවිසුම්, සැලසුම්, බලපත්‍ර හා ලිපි ලේඛන ඇතුළත් ගොනුවක් පවත්වා ගැනීම.

**1.2.1.2. ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතනයේ (Implementing Agency) වගකීම හා කාර්යභාරය**

- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ අදාළ අනෙකුත් අධිකාරීන් විසින් කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛ, රෙගුලාසි සහ මාර්ගෝපදේශ ප්‍රකාරව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම හා අධීක්ෂණය.
- ව්‍යාපෘතියේ අපේක්ෂිත නිමවුම හා ප්‍රතිඵල සැලසුම් කළ කාලපරිච්ඡේදය තුළ ළඟා කර ගැනීම.
- ව්‍යාපෘතියට අදාළව අවශ්‍ය තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් විධායක නියෝජිත ආයතනයට සහාය දැක්වීම හා අවශ්‍ය තොරතුරු සැපයීම.
- විධායක නියෝජිත ආයතනය විසින් ව්‍යාපෘතියට අදාළව ක්‍රියාත්මක කරනු ලබන ප්‍රසම්පාදන කටයුතුවලට සහායවීම.
- කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ ප්‍රකාරව ව්‍යාපෘති විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් පැවැත්වීම.
- ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන රැස්වීම් මාසිකව පැවැත්වීම.

**2. ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම, යෝජනා ඇගයීම හා අනුමත කර ගැනීම, අධීක්ෂණය සහ ප්‍රගතිය ඇගයීම**
**(Project Identification, Planning, Appraisal & Approval, Monitoring and Evaluation)**

පාරිසරික, සාමාජීය, ආර්ථික, මූල්‍ය සහ තාක්ෂණික වශයෙන් තිරසාර සහ ධනාත්මක බලපෑම් ඇති වීම සහතික වන අයුරින් සංවර්ධන ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමට අදාළ සියලු පාර්ශ්වයන් වග බලා ගත යුතු ය. එමෙන් ම ව්‍යාපෘතීන් හි අපේක්ෂිත ප්‍රතිඵලවල තිරසාරභාවය තහවුරු කර ගැනීම සඳහා ඒ සම්බන්ධ ප්‍රතිලාභීන්, නියාමන ආයතන ඇතුළු පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා හා අපේක්ෂාවන් සමඟ ව්‍යාපෘති අරමුණු සමපාත වන බව තහවුරු කර ගත යුතු ය. ව්‍යාපෘතියේ පාරිසරික, සාමාජීය හා ආර්ථික බලපෑම තක්සේරු කිරීම සඳහා ශක්තිමත් අධීක්ෂණ හා ඇගයීම් ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතු අතර කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා තොරතුරු මත පදනම් වූ තීරණ ගැනීම කළ යුතු ය.

2.1. සංවර්ධන ව්‍යාපෘති අනුමත කර ගැනීමේ දී, රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, රජය සතු ව්‍යාපාර හා සමාගම් ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශයේ 2019.01.10 දිනැති අංක MNPEA 02/2019 දරන චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු ය. ඒ අනුව, අදාළ ව්‍යාපෘති යෝජනා සඳහා මූලික අනුමැතිය/නිර්දේශ හා/හෝ අවසාන අනුමැතිය/නිර්දේශ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් ලබා දෙනු ඇති අතර එකී චක්‍රලේඛය ප්‍රකාරව අවශ්‍යය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු ය.

2.2. 2.1 අනුව අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2023.06.16 දිනැති අයවැය චක්‍රලේඛ 03/2023 හි 2 ඡේදයෙහි දක්වා ඇති කොන්දේසිවලට අදාළ වන්නේ නම්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් නව සංවර්ධන ව්‍යාපෘති /වැඩසටහන් ක්‍රමානුකූලව ඇගයීම සඳහා වන ජාතික සංවර්ධන කමිටුව වෙත ඉදිරිපත් කරනු ඇත. මෙම කමිටුව මගින් රාජ්‍ය වියදම් විචක්ෂණශීලීව හා ඵලදායී ලෙස යෙදවීම මගින් ඒවායේ අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම තහවුරු කිරීමට ව්‍යාපෘති යෝජනා සමස්තයක් ලෙස සලකා ඇගයීමක් සිදු කරනු ඇත. එමෙන් ම, මෙම කමිටුව විසින් අමාත්‍ය මණ්ඩලය වෙත අවසන් නිර්දේශය ලබා දෙනු ඇත.

2.3. රේඛීය අමාත්‍යාංශ විසින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ව්‍යාපෘති යෝජනා සඳහා එම දෙපාර්තමේන්තුව විසින් ඇගයීම් වාර්තා (Project Appraisal Reports) සකස් කිරීමේ දී ඇතැම් ව්‍යාපෘති සඳහා ව්‍යාපෘතියට අදාළ වන සේ කොන්දේසිවලට (Conditions) යටත්ව ව්‍යාපෘති නිර්දේශ කරනු ලැබේ. එම කොන්දේසි ව්‍යාපෘති යෝජනා ඇගයීම් වාර්තාවේ දක්වා ඇති ආකාරයට සිදු වන්නේ ද යන්න විධායක නියෝජිත ආයතනය, මෙහෙයුම් කමිටුව හා ව්‍යාපෘති විගණන හා කළමනාකරණ කමිටුව විසින් විමර්ශනය / පසුවිපරම් කළ යුතු ය.

2.4. 2019.01.10 දිනැති MNPEA 02/2019 චක්‍රලේඛය පරිදි ව්‍යාපෘති යෝජනාව සඳහා මූලික අනුමැතිය ලබා ගැනීමෙන් පසු සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තාවක් / ශක්‍යතා අධ්‍යයනයක් සිදු කළ යුතු ය. එම වාර්තා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගැනීම සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සිදු කළ යුතු ය.

2.5. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ERD/IRCPRS/GEN/10 අංක දරන 2020/02/17 දිනැති ලිපිය ප්‍රකාරව උපදේශන සේවා, නව ගොඩනැගිලි ඉදි කිරීම සහ වාහන මිල දී ගැනීමේ දී හැකිතාක් පිරිවැය අවම වන ලෙස කටයුතු කළ යුතු ය.

2.6. රජයේ අමාත්‍යාංශ හා පළාත් සභා විසින් සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා විදේශීය රටවල් සමග කලාපීය සහයෝගීතාවය යටතේ ද්විපාර්ශ්වීය හා බහුපාර්ශ්වීය එකඟතාවයන් හා අවබෝධතා ගිවිසුම්වලට එළඹීමේ දී මෙන්ම විදේශ මූල්‍යායන ආයතන සමග කටයුතු කිරීමේ දී ජනාධිපති ලේකම්ගේ අංක PS/EAD/Circular/16/2022 හා 2023.01.09 දිනැති චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු ය. එමෙන්ම මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2023.03.24 දිනැති MF/ERD/2023/02 චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත් අනුමැතියක් ලබා ගැනීමකින් තොරව රාජ්‍ය ආයතන විදේශ මූල්‍යායනය සඳහා සංවර්ධන ව්‍යාපෘති පිළියෙළ කිරීමේ දී සංවර්ධන පාර්ශ්වකරුවන් සමග ඍජුව සම්බන්ධ නොවිය යුතු ය.

2.7. විදේශ මූල්‍යායන මූලාශ්‍රය තීරණය කිරීමේ දී ණය ගැනීම සඳහා වන පිරිවැය, පසුගිය අත්දැකීම් සහ ක්‍රියා පටිපාටි, කොන්දේසි හා අදාළ ණය දෙන ආයතනයේ ප්‍රවීණත්වය ආදී අංශ සැලකිල්ලට ගනු ලැබේ. රජය සහ අදාළ ණය දෙන ආයතනවල වාර්ෂික උපදේශන ක්‍රියාවලිය

තුළ දී අනුමත සංවර්ධන ව්‍යාපෘති යෝජනා හැකිතාක් දුරට අදාළ ණය දෙන ආයතනවල ව්‍යාපෘති ප්‍රමුඛතා ලේඛනයට (Project Pipeline /Country Partnership Strategy) ඇතුළත් කිරීමට විදේශ සම්පත් දෙපාතර්තමේන්තුව ක්‍රියා කරනු ඇත.

2.8. ණය/ප්‍රදාන ගිවිස ගැනීමේ සාකච්ඡාවල (Loan/Grant Negotiations) ප්‍රතිඵලයක් ලෙස හෝ වෙනත් හේතූන් මත ව්‍යාපෘති විෂයපථයේ සැලකිය යුතු වෙනස්කම් සිදු වන්නේ නම් එම වෙනස්කම් ව්‍යාපෘතියට ඇතුළත් කිරීම සඳහා අදාළ අනුමත කිරීමේ අධිකාරීත්වයේ අනුමැතිය ලබා ගත යුතු ය.

2.9. ව්‍යාපෘති යෝජකයින් විසින් සිය කැමැත්තෙන් ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනා (Unsolicited Investment Project Proposals) ඒ වෙනුවෙන් නිකුත් කර ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව විවෘත තරඟකාරීත්වයට ඉදිරිපත් කර වඩාත් වාසිදායක යෝජනාව තෝරා ගැනීමට කටයුතු කළ යුතු ය.

2.10. අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන සියලුම ව්‍යාපෘතිවල ප්‍රගතිය මාස 06 කට වරක් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය.

2.11. ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී ප්‍රධානත්වයෙන් ව්‍යාපෘතීන්ට අදාළව මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්විය යුතු ය. විධායක නියෝජිත ආයතනයේ / ක්‍රියාත්මක කරන ආයතනයේ පරිපාලන, මූල්‍ය, සැලසුම් සහ ඉංජිනේරු අංශ විසින් ව්‍යාපෘතීන් ට අදාළ නියමිත උප අංශ නිරන්තර අධීක්ෂණයට ලක් කර ගැටලු පවතී නම් හඳුනාගෙන ඒවායේ ස්වභාවය අනුව ප්‍රගති සමාලෝචන රැස්වීම්, ව්‍යාපෘති මෙහෙයුම් කමිටු හෝ ව්‍යාපෘති විගණන හා කළමණාකරන කමිටු රැස්වීම්වලට ඉදිරිපත් කර අවශ්‍ය විසඳුම් ලබා දීමට කටයුතු කළ යුතු ය.

2.12. ව්‍යාපෘතියෙහි කාර්තු ප්‍රගති වාර්තා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවට හා/හෝ අදාළ අනෙකුත් ආයතන වෙතින් දී ඇති ආකෘතීන් ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු ය.

2.13. ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ චක්‍රලේඛ 01/2024 හි විධිවිධාන පරිදි රාජ්‍ය අංශයේ සියලු ආයතන ජාතික ඇගයීම් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ රාමුවට අනුගතව 2024 වර්ෂයේ සිට සංවර්ධන ඇගයීම් (වැඩසටහන්/ව්‍යාපෘති) සිදු කළ යුතු ය.

## 3. ව්‍යාපෘති සහ නැවත පදිංචි කිරීම් සඳහා ඉඩම් පවරා ගැනීම

3.1. ව්‍යාපෘතියේ අනුමත සැලැස්ම (Approved Design) අනුව වැඩබිමේ මායිම් ස්ථිරව හඳුනා ගැනීම කළ යුතු ය.

3.2. ව්‍යාපෘති සඳහා ඉඩම් පවරා ගැනීමේ දී ඒවායෙහි ස්වභාවය අනුව හැකි සෑමවිටම රජයේ සංවර්ධනය නොවූ ඉඩම් සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතු ය.

3.3. මු.රෙ 53 ඉඩම් හා ගොඩනැගිලි අත්කර ගැනීම යටතේ වූ ප්‍රතිපාදන තුළින් පෞද්ගලික ඉඩමක් අත්කර ගැනීම කළ හැක්කේ රජයේ සුදුසු ඉඩම් නොමැති නම් පමණි.

3.4. වැඩබිමේ සීමාව තුළ පවරා ගත යුතු ඉඩම් සම්බන්ධයෙන් භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) හෝ සුදුසු ක්‍රමවේදයකට අනුව සැලැස්මක් සකස් කිරීම සහ ඒ සම්බන්ධයෙන් අදාළ තොරතුරු එකතු කර ගැනීම සිදු කළ යුතු ය.

3.5. 1950 අංක 09 දරන ඉඩම් අත් කර ගැනීම් පනත සහ අනෙකුත් අදාළ නීති රීතිවලට යටත්ව ඉඩම් අත් කරගැනීම සම්බන්ධ සියලුම පාර්ශ්වයන් සම්බන්ධීකරණය සහ අත් කර ගන්නා ලද ඉඩම් පිළිබඳ නිවැරදි වාර්තා තබා ගැනීම සිදු කළ යුතු ය.

3.6. ඉඩම් අත් කර ගැනීම සඳහා අයදුම් පත්‍රයක් ඉඩම් විෂයයභාර අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කිරීමට පෙර ඉඩම් අත් කර ගැනීමේ පණතට අදාළ 248 නියෝගයේ (1) (අ) යටතේ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් අනිවාර්යයෙන් කටයුතු කළ යුතු ය.

3.7. අදාළ භූමිය සම්බන්ධයෙන් ව්‍යාපෘතියේ ස්වභාවය අනුව ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ (NBRO) නිර්දේශය හා අනුමැතිය අවශ්‍ය වන්නේ නම් ඒ අනුව කටයුතු කළ යුතු ය.

3.8. ව්‍යාපෘතියේ ස්වභාවය අනුව අවශ්‍ය වන්නේ නම් පමණක් පුරා විද්‍යා දෙපාර්තමේන්තුව සහ වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වැනි අනෙකුත් ආයතනවලින් ද නිසි අවසරයක් ලබා ගත යුතු ය.

3.9. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම නිසා කිසියම් පොදු ස්ථාවර වත්කමක්/ නිර්මිතයක් ප්‍රතිෂ්ඨාපනය කළ යුතු නම් එම වත්කම් ද හඳුනා ගෙන ලේඛනගත කළ යුතු ය.

3.10. දේශීය මූල්‍යාන ව්‍යාපෘති සම්බන්ධයෙන් ඉඩම් අත් කර ගැනීමේ පනතේ 38 ‘අ’ ආඥාව ක්‍රියාත්මක කළ යුතු අතර හදිසි අවශ්‍යතාවයක දී පමණක් 38 ‘අ’ අතුරු විධාන ආඥාව ක්‍රියාත්මක කළ යුතු ය. මෙහි දී අතුරු විධාන යටතේ කඩිනම් භුක්තිය භාර ගන්නේ නම් ඒ සඳහා ප්‍රමාණවත් කරුණු සහිත සාධාරණීකරන වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර සැලසුම් කළ කාලය තුළ අදාළ කටයුතු නිම කිරිමට ද වග බලා ගත යුතු ය. විදේශ මූල්‍යාන ව්‍යාපෘති සම්බන්ධයෙන් මූල්‍යයන ආයතනයේ කොන්දේසි අනුව ද ඉඩම් අත් කර ගැනීම සිදු කළ යුතු ය.

3.11. නැවත පදිංචි කිරීම් අවශ්‍ය වන අවස්ථාවන්වල දී නැවත පදිංචි කිරීමේ සැලැස්මක් (Resettlement Action Plan/ Implementation Plan ) සකස් කිරීම සිදු කළ යුතු අතර එහි දී මූල්‍යයන ආයතනය විසින් ලබා දී ඇති කොන්දේසි ද අදාළ කර ගත යුතු ය. නැවත පදිංචි කිරීමේ සැලැස්ම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු අතර ව්‍යාපෘති සම්බන්ධයෙන් ස්ව කැමැත්තෙන් තොරව අවතැන් වුවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය (Sri Lanka National Involuntary Resettlement Policy - 2001) යටතේ හෝ විදේශ මූල්‍යාන ව්‍යාපෘතියක් නම් එම අදාළ ණය දෙන ආයතනයේ නිර්ණායක යටතේ නැවත පදිංචි කිරීමේ කටයුතු කළ යුතු ය.

3.12. ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත් ප්‍රදානයට ප්‍රථම ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් අත් කර ගැනීම, උපයෝගීතා සේවාවන් ප්‍රතිස්ථාපනය කිරීම ඇතුලු අදාළ කටයුතු හැකිතාක් දුරට නිරාකරණය වී තිබිය යුතු ය.

3.13. ව්‍යාපෘතියෙහි උපදේශකවරයෙකු (ඉඩම් අත් කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ විශේෂඥයෙකු ) සිටී නම් ඉඩම් පවරා ගැනීම ඔහුගේ උපදෙස් හා අධීක්ෂණය යටතේ සිදු කළ යුතු ය.

3.14. ව්‍යාපෘතිය ප්‍රමාදයකින් තොරව පවත්වා ගෙන යාමට හැකි වන ආකාරයට වැඩ බිමට අදාළ භූමියේ ඇති විදුලි කණු, දුරකථන රැහැන්, ජලනල වැනි උපයෝගීතා සැපයුම් හා ඒ ආශ්‍රිත උපාංග ආදිය අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් ඉවත් කිරීම අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් සිදු කළ යුතු ය.

3.15. ව්‍යාපෘති වෙනුවෙන් අත් කර ගන්නා ඉඩම් සඳහා වන්දි මුදල් ගෙවීමට හා අවතැන් වූ පවුල් නැවත පදිංචි කිරීම සඳහා දැරීමට සිදුවන වියදම්, වාර්ෂික අය වැය ප්‍රතිපාදන යටතේ වෙන් කරවා ගත යුතු ය. නැවත පදිංචි කළ පාර්ශ්වයන්ට ඔප්පු ලබා දීම හා වන්දි ගෙවීම් කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය සම්බන්ධීකරණය හා සහාය ප්‍රාදේශීය ලේකම් වෙත ලබා දිය යුතු ය. අභියාචනා සම්බන්ධයෙන් 2013 ඉඩම් අත්කර ගැනීමේ නියෝග අනුව කටයුතු කළ යුතු ය.

3.16. 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදංචි කිරීමේ පනත යටතේ හිමිකම් සහතිකයක් ලබා දී ඇති බිම් කොටසක් රජයට අත් කර ගැනීමේ දී එම අත් කර ගන්නා කොටස අනු බෙදුමක් කර කොටස් දෙකම අයිතිකරු නමින් ලියාපදිංචි කර අත් කර ගැනීමේ ක්‍රියාවලියෙන් පසු රජයට අත් කර ගන්නා කොටස රජය නමින් හෝ ආයතනය නමින් ද ඉතිරි කොටස පුද්ගලයා නමින් ද හිමිකම් ලියාපදිංචි කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත උප ලේඛනය යොමු කළ යුතු ය. (2308/27: 2022/12/01 අතිවිශේෂ ගැසට් නිවේදනය7 xvi වගන්තියට අදාළ වන පරිදි )

3.17. නීතිමය ගැටලු සහිත ඉඩම් සම්බන්ධයෙන් අවශ්‍ය අධිකරණමය කටයුතු කඩිනමින් අවසන් කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

3.18. අත් කර ගනු ලබන ඉඩම්වලට වන්දි ගෙවීමේ දී මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත අවශ්‍ය අත්මුදල් කඩිනමින් ලබා ගෙන අනවශ්‍ය ප්‍රමාදයන් නිසා ඇති වන පොළී ගෙවීම් අවම කර ගැනීමට ද කටයුතු කළ යුතු ය.

3.19. ඉඩම් පවරා ගැනීමේ කටයුතු අවසාන වීමෙන් පසු ඉඩම් අත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් මගින් අදාළ භූමියේ භුක්තිය අදාළ ක්‍රියාත්මක කරන ආයතනයට පවරා ගැනීමට කටයුතු කළ යුතු ය.

3.20. ඉඩම් පවරා ගැනීම් හා නැවත පදිංචි කිරීම්වලට අදාළ සියලුම ලේඛනවල සහතික කළ පිටපත් සහිත ගොනුවක් ව්‍යාපෘතිය සතු විය යුතු අතර ව්‍යාපෘති නිම වීමෙන් පසුව එම ගොනුව විධිමත් පරිදි අදාළ රේඛීය අමාත්‍යාංශය වෙත භාරදීමට කටයුතු කළ යුතු ය.

3.21. ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් වන සංක්ෂිප්ත සටහන ඇමුණුම් i මගින් ඉදිරිපත් කර ඇත.

## 4. ව්‍යාපෘති අධ්‍යක්ෂගේ හා ව්‍යාපෘතියෙ හි ප්‍රධාන අංශයන් හි වගකීම හා කාර්යභාරය

### 4.1. ව්‍යාපෘති අධ්‍යක්ෂගේ වගකීම හා කාර්යභාරය

4.1.1. කළමනාකරණ සේවා චක්‍රලේඛ ප්‍රකාරව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා පූර්ණකාලීනව පත් කළ යුතු අතර එලෙස පත්කර ගන්නා ලද ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා ව්‍යාපෘතිය අවසන් කර එය විධිමත් පරිදි භාර දෙන තෙක් ධූරයේ රඳවා ගැනීමට වග බලා ගත යුතු ය. එසේම නව පත්වීම භාර දීමට ප්‍රථම කලින් වගකීම් දරනු ලැබ ඇති ව්‍යාපෘති නියමිත කාලරාමුව තුළ නිසි පරිදි නිම කර ඇත් ද යන්න

එකී ව්‍යාපෘති සිදු කළ ආයතනයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී / ගණන්දීමේ නිලධාරි මගින් සනාථ කර ගත යුතු ය.

4.1.2. ව්‍යාපෘතිය සඳහා ලබා දී ඇති සම්පත් සඵලදායීව සහ උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව කළමනාකරණය කිරීම කළ යුතු ය. එමෙන් ම ප්‍රමාදයකින් හා සම්පත් අපතේ යාමකින් තොරව නියමිත කාලය තුළ දී ව්‍යාපෘති කාර්යයන් නිම කර ගැනීම සඳහා අදාළ ව්‍යාපෘතියට සම්බන්ධ සියලුම අංශ සම්බන්ධීකරණය කළ යුතු ය.

4.1.3. ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් ව්‍යාපෘති කටයුතු මෙහෙයවීම, පාලනය, අධීක්ෂණය, සමාලෝචනය සිදු කළ යුතු අතර අවසාන ගිණුම් පිළියෙල කර නියමිත කාලය තුළ අදාළ පාර්ශ්වයන්ට ඉදිරිපත් කිරීම හා ව්‍යාපෘති කටයුතු සම්බන්ධයෙන් වගවීමට ද බැඳී සිටිය යුතු ය.

4.1.4. කොන්ත්‍රාත්කරුවන්ගේ හා උපදේශකගේ කාර්යභාරය සමීප අධීක්ෂණයකට ලක් කිරීමත් ඔවුන් විසින් සම්පත් උපරිම කාර්යක්ෂමතාවයකින් යොදවා ඇති බව තහවුරු කර ගැනීමත් සිදු කළ යුතු ය.

4.1.5. කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්කරුවන් හා ව්‍යාපෘති උපදේශකගේ කාර්යසාධන අධීක්ෂණය හා ඔවුන්ගේ කටයුතු පාලනයකට යටත් කිරීමත්, අදාළ ප්‍රසම්පාදන ලියවිලිවල කොන්දේසි, ණය දෙන ආයතනයේ ගිවිසුම් හා දේශීය කොන්ත්‍රාත්කරුවන්ට බලපාන කොන්දේසි අනුව කටයුතු කිරීමත් කළ යුතු ය.

4.1.6. ව්‍යාපෘති ඉංජිනේරු කාර්යමණ්ඩලය සමීපව අධීක්ෂණය කිරීම හා ඔවුන්ගේ කාර්යසාධනය ඇගයීම විධිමත්ව සිදු කළ යුතු ය.

## 4.2. ව්‍යාපෘති පරිපාලනය

4.2.1. කළමනාකරණ සේවා චක්‍රලේඛ විධිවිධානවලට හා මූල්‍යයන ආයතනයේ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි කාර්යමණ්ඩල බඳවා ගැනීම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ය.

4.2.2. ප්‍රධාන වගකිව යුතු නිලධාරීන් නිශ්චය කර ඔවුන්ගේ නිශ්චිත කාර්යභාරය (TOR) හා එම කාර්යභාරය ඉටු කරනු ලබන බව සනාථ කිරීමට ප්‍රධාන කාර්ය සාධක දර්ශක (KPI) හඳුනා ගැනීම කළ යුතු ය. එමෙන්ම සේවා දිගු ලබා දීම හැකිතාක් දුරට කාර්යසාධනය මත පදනම්ව සිදු කළ යුතු ය.

4.2.3. අදාළ කාර්යභාරය ඉටු කිරීම සඳහා නිශ්චිත රාජකාරී පැවරීමක් (List of Duties) සිදු කළ යුතු ය. මු.රෙ 135 ප්‍රකාරව අදාළ නිලධාරීන්ගේ රාජකාරී ස්වභාවය හා පළපුරුද්ද අනුව මූල්‍ය පාලනය සඳහා බලතල පවරා දිය යුතු ය.

4.2.4. සමස්ත ව්‍යාපෘති සැලැස්ම ක්‍රියාත්මක කිරීම හා ව්‍යාපෘති වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු ය. මෙම ක්‍රියාකාරී සැලැස්ම සැකසීමේ දී ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම්වලට අදාළව ප්‍රධාන කාර්ය සාධක දර්ශක (KPIs) හඳුනා ගැනීමත් ඒ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීමත් කළ යුතු ය. ව්‍යාපෘතියේ ප්‍රමුඛව නිම කළ යුතු තීරණාත්මක ක්‍රියාකාරකම් (Critical Activities) සහ සෙසු

ක්‍රියාකාරකම් සමග පවතින අන්තර් සම්බන්ධතා නිවැරදිව හඳුනා ගනිමින් ප්‍රමාදයකින් තොරව අපේක්ෂිත කාලරාමුව තුළ ව්‍යාපෘතිය නිම කිරීමට සැලසුම් කළ යුතු ය.

4.2.5. ව්‍යාපෘති කළමනාකරණ කටයුතු සංවිධානය කිරීම, විධිමත් කිරීම හා අවශ්‍යතාවය අනුව යාවත්කාලීන කර අවශ්‍ය උපදෙස් ලබා දීම ක්‍රියාත්මක කරන ආයතනය හා විධායක නියෝජිත ආයතනය සමග සම්බන්ධීකරණයෙන් සිදු කළ යුතු ය.

4.2.6. ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ව්‍යාපෘති කාර්යමණ්ඩලයේ පැමිණීම, පිටවීම, නිවාඩු කටයුතු සහ ක්ෂේත්‍ර කටයුතු සඳහා බැහැර යාම සඳහා විධිමත් ක්‍රමවේදයන් ස්ථාපිත කළ යුතු ය.

4.2.7. වත්කම් පරිපාලනය, අධීක්ෂණය හා භාරකාරීත්වය, නඩත්තුව, රක්ෂණය කිරීම හා අනෙකුත් කටයුතු විධිමත් පාලනයකින් සිදු කළ යුතු ය.

4.2.8. මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ අංක MOFE&PD/ERD/2020/1 හා 2020.02.12 දිනැති චක්‍රලේඛයේ අංක 05 හි සඳහන් විධිවිධාන අනුව ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්විය යුතු අතර එම කමිටු රැස්වීම් වාර්තා සති දෙකක් ඇතුළත කමිටුව නියෝජනය කරන ආයතන වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු ය.

4.2.9. ව්‍යාපෘතියෙහි සියලු අභ්‍යන්තර අංශ සම්බන්ධ කර මාසික ප්‍රගති සමාලෝචනය සඳහා සැලැස්මක් සැකසීම හා ඒ අනුව ඇගයීම ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් සිදු කළ යුතු ය.

4.2.10. නිශ්චිතව සඳහන් කර නොමැති හෝ නිකුත් කර ඇති චක්‍රලේඛවල අපැහැදිලිතාවයන් පවතින අවස්ථාවන්හී දී අදාළ ආයතනවලින් විමසා නිරවුල් කර ගත යුතු ය. එමෙන්ම යම් අවස්ථාවක දී චක්‍රලේඛවලින් ආවරණ නොවන කරුණක් උද්ගත වූ විට ව්‍යාපෘති විධායක නියෝජිත ආයතනයේ උපදෙස් පරිදි කටයුතු කළ යුතු අතර එම චක්‍රලේඛ හා පනත් සම්බන්ධයෙන් අදාළ ආයතන සමග සාකච්ඡා කර එකඟතාවයෙන් පසුව ඒ අනුව කටයුතු කිරීමට ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් උපදෙස් නිකුත් කිරීම සිදු කළ යුතු ය.

## 4.3. තාක්ෂණික /ඉංජිනේරුමය කටයුතු

4.3.1. කොන්ත්‍රාත්කරුගේ වැඩ සැලැස්මට අනුව නියමිත කාලය තුළ නියමිත ගුණාත්මක අමුද්‍රව්‍ය භාවිත කරමින් අදාළ පිරිවිතරයන්ට අනුකූලව නියමිත කාර්යයන් ඉටු කළා ද යන්න අධීක්ෂණය කිරීම සහ නියමිත ඉංජිනේරු තාක්ෂණය යොදා ගන්නේ ද යන්න සහතික කළ යුතු ය.

4.3.2. තාක්ෂණික /ඉංජිනේරු කාර්යමණ්ඩල සඳහා නිශ්චිත වගකීම් (TOR) හා ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) හඳුන්වා දී තිබිය යුතු ය. එමෙන් ම නිශ්චිත කාර්යය පැවරීමක් ද සිදු කර තිබිය යුතු ය.

4.3.3. අදාළ අධීක්ෂණ ඉංජිනේරුවරුන් සඳහා නිශ්චිත කාර්යභාරයක් පවරා තිබිය යුතු ය.

4.3.4. ක්ෂේත්‍ර ඉංජිනේරුවන් විසින් තම කාර්යයන් පිළිබඳව මාසිකව ඉදිරි මාසය සඳහා වැඩ සැලැස්ම ඉදිරිපත් කළ යුතු අතර ක්ෂේත්‍ර සටහන් පොත් පවත්වා ගැනීම සහ එදිනෙදා ප්‍රගතිය පිළිබඳව සටහන් පවත්වා ගැනීමත් සිදු කළ යුතු අතර මාසික කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

4.3.5. ප්‍රගති සමාලෝචන රැස්වීම්වල දී අපගමනයන් තිබේ නම් අදහස් දැක්වීම සහ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම සිදු කළ යුතු ය. එම නිරීක්ෂණ ප්‍රගති සමාලෝචන කමිටු රැස්වීම් වාර්තාවලට ඇතුළත් කළ යුතු ය.

4.3.6. ඉඩම් අත්කර ගැනීම සහ නැවත පදිංචි කිරීමට අදාළ පාර්ශ්වයන්ට අවශ්‍ය අවස්ථාවල දී සහය දැක්වීම සිදු කළ යුතු ය.

4.3.7. භාවිත කිරීම සඳහා ලබා දී ඇති වත්කම්වල භාරකාරීත්වය, නඩත්තුව හා වාර්තා කිරීම සම්බන්ධයෙන් විධිමත් පාලනයක් පවත්වා ගත යුතු ය.

4.3.8. මු.රෙ. 237 අනුව අදාළ වන ආකාරයෙන් විශේෂ සහතික ලබා දීම කළ යුතු ය.

4.3.9. කොන්ත්‍රාත් පරිපාලන කටයුතු මූලික වශයෙන් ව්‍යාපෘතියේ සිටින ඉංජිනේරුවරුන්ගේ සහාය ඇතිව ක්‍රියාත්මක කළ යුතු ය.

## 4.4. ප්‍රසම්පාදන කටයුතු

4.4.1. ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අනුමත කරනු ලබන ව්‍යාපෘති ප්‍රසම්පාදන සැලැස්මට අනුව කටයුතු කළ යුතු අතර ප්‍රසම්පාදන සැලැස්මේ යම්කිසි වෙනසක් සිදු වන්නේ නම් නැවත මෙහෙයුම් කමිටු අනුමැතිය ලබා ගත යුතු ය.

4.4.2. අනුගමනය කළ යුතු ප්‍රසම්පාදන ක්‍රමවේදය, මූල්‍යායන ආයතනයක් විසින් නිශ්චය කර නොමැති සෑම අවස්ථාවකදී ම 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් සහ ඊට අදාළ පරිපූරක සංශෝධනයන්හි විධිවිධාන මෙන්ම පසුව නිකුත් කරනු ලැබ ඇති මාර්ගෝපදේශයන් ද අනුගමනය කළ යුතු ය.

4.4.3. සමස්ත ප්‍රසම්පාදනයේ වටිනාකම අනුව ප්‍රසම්පාදන කමිටුවේ සංයුතිය තීරණය කර ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිලධාරීන් පත්කර ගැනීම අදාළ ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අදාළ අධිකාරී බලය ලබා ගෙන සිදු කළ යුතු ය. සමස්ත ප්‍රසම්පාදනය, හුදෙක් පහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටු මගින් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් කොටස්වලට වෙන් කර ක්‍රියාත්මක කිරීම කිසිසේත් සිදු නොකළ යුතු අතර, එම ප්‍රසම්පාදන වටිනාකමට අදාළ ප්‍රසම්පාදන කමිටුව හරහා පිරිවැය වශයෙන් ඵලදායී වන වාසිදායක ක්‍රමවේදය අනුගමනය කරමින් සිදු කිරීමට වග බලා ගත යුතු ය.

4.4.4. රජය විසින් මූල්‍යායන කරන ව්‍යාපෘති සඳහා වාහන මිල දී ගැනීමේ දී එම වාහන අදාළ අමාත්‍යාංශ ලේකම් නමින් හෝ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී නමින් ලියාපදිංචි කළ යුතු ය.

4.4.5. ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා සාමාජිකයින් පත් කිරීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව සිදු කළ යුතු ය.

4.4.6. ප්‍රසම්පාදනය සඳහා අවශ්‍ය ලංසු ලේඛන සකස් කිරීම ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් සිදු කළ යුතු ය.

4.4.7. ප්‍රසම්පාදන අස්ථිත්ව විසින් විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමවේදය (e- GP) සම්බන්ධයෙන් දැනට නිකුත් කර ඇති සහ ඉදිරියේ දී නිකුත් කරනු ලබන චක්‍රලේඛයන්ට අනුගත වෙමින් විද්‍යුත් ප්‍රසම්පාදනය සඳහා අනුගත විය යුතු ය.

## 5. ව්‍යාපෘති නිම කිරීම හා වත්කම් පැවරීම

5.1. ව්‍යාපෘති නිම කිරීමේ ක්‍රියාවලියේ දී ව්‍යාපෘති අධ්‍යක්ෂ, ප්‍රධාන ගණන්දීමේ නිලධාරී / ගණන්දීමේ නිලධාරී සමඟ සෘජුව සම්බන්ධව කටයුතු කළ යුතු ය.

5.2. ව්‍යාපෘති නිම කිරීමේ කටයුතු වෙනුවෙන් විධිමත් සැලැස්මක් සකස් කළ යුතු ය. මෙහිදී එම කටයුතුවල ස්වභාවය අනුව අදාළ පාර්ශ්වකරුවන් හඳුනා ගෙන ඔවුන්ගේ වගකීම හා කාර්යයන් පැහැදිලිව නිශ්චය කළ යුතු අතර ඒ සඳහා නියමිත කාල රාමුවක් ද තීරණය කළ යුතු ය.

5.3. ව්‍යාපෘතියෙහි පාර්ශ්වකරුවන් හා සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ව්‍යාපෘති නිම කිරීමේ ක්‍රියාවලිය, ගත යුතු පියවර හා නියමිත කාලවකවානුව පිළිබඳව පූර්ව දැනුම් දීමක් සිදු කළ යුතු ය.

5.4. ව්‍යාපෘති කටයුතු පිළිබඳ සමාලෝචනයන් සිදු කොට ව්‍යාපෘතිය නිම කිරීමට පෙර සිදු කළ යුතු කාර්යයන් පැහැදිලිව හඳුනා ගත යුතු ය. එමෙන්ම ගිවිසුම් ප්‍රකාරව තවදුරටත් ඉටු කළ යුතු අවශ්‍යතා කෙරෙහි ප්‍රමුඛතාවය දී අදාළ පාර්ශ්වකරුවන් සමග එකඟතාවයකින් එම කටයුතු නිරවුල් කිරීමට ද පියවර ගත යුතු ය.

5.5. ව්‍යාපෘති වත්කම් පැවරීමේ ක්‍රියාපටිපාටිය පහත සඳහන් පරිදි සිදු විය යුතු ය.

- භාණ්ඩ සමීක්ෂණයට අනුව පැවරිය යුතු වත්කම්, එම වත්කම්වල භාරකාරීත්වය, වර්තමාන තත්ත්වය හා වටිනාකම නිශ්චය කොට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත පැවරිය යුතු ය.
- එම වත්කම්වල වගකීම් සහතික නියමිත පරිදි ලබා දීම සහ නඩත්තු සේවා ගිවිසුම්වල වර්තමාන තත්ත්වය යාවත්කාලීන කළ යුතු ය
- පවරා ගන්නා ලද ඉඩම් සම්බන්ධයෙන් ඉඩම් අත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය අනුව කටයුතු කර ඇති බව සනාථ කළ යුතු ය.
- ව්‍යාපෘති ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ සහ ව්‍යාපෘතියේ සියලුම වත්කම් (ඉදිකිරීම්, වැඩිදියුණු කිරීම්, සවිකිරීම්, උපකරණ, උපාංග) ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත විධිමත්ව පැවරීම සිදු කළ යුතු අතර ඒවා මු.රෙ. 751 (භාණ්ඩ ලේඛන, ගණන් තැබීම හා භාරය) අනුව ක්‍රමවත්ව ලේඛනගත විය යුතු ය.
- ව්‍යාපෘති සඳහා භාර දෙන වාහන නැවත නිසි පරිදි අදාළ රේඛීය අමාත්‍යාංශයට භාර දෙන බව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා මෙන්ම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා ද තහවුරු කර ගත යුතු ය.
- බදු නිදහස යටතේ ආනයනය කරනු ලබන වාහන හා උපකරණ තෙවන පාර්ශ්වයක් වෙත පවරන අවස්ථාවල දී ආනයනයේ දී ඒ සඳහා ගෙවිය යුතු වූ බදු මුදල් නැවත රජයට ගෙවිය යුතු ය.
- ව්‍යාපෘතියේ ප්‍රයෝජනය සඳහා මිල දී ගනු ලබන ක්ෂය කළ යුතු වත්කම්වල වාර්ෂික ක්ෂය ප්‍රමාණය ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ වටිනාකමට ඇතුළත් කළ යුතු අතර ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසු අදාළ වත්කමේ ඉතිරි ඵලදායී ජීවිත කාලය පදනම් කර ගෙන ගණනය කරන ලද වටිනාකම අමාත්‍යාංශය වෙත පැවරිය යුතු ය.
- ඩිජිටල් වත්කම් (තොරතුරු පද්ධති, මෘදුකාංග වැනි) පැවරීමේ දී මෘදුකාංග බලපත්‍රයන් හා ව්‍යාපෘතිය වෙනුවෙන්ම නිම කළ වැඩසටහනක් නම් මූලාශ්‍ර කේතයන් (Source Codes) ඇතුළු අනෙකුත් අත්‍යවශ්‍ය අයිතමයන් ද ලබා දීමට කටයුතු කළ යුතු ය.

- ව්‍යාපෘති කාලසීමාව අවසන් වීමෙන් පසු ව්‍යාපෘතිය යටතේ ගොඩනගන ලද වත්කම්වල ඵලදායී භාවිතය හා ඉදිරි නඩත්තු කටයුතු සම්බන්ධයෙන් සහතික කර ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම සුදුසු ය.
- ව්‍යාපෘති නිමවීමෙන් පසු වත්කමක් ලෙස ගොඩ නැගෙන නිමැවුම්වල මුළු පිරිවැය හෝ වෙළඳපොළ වටිනාකම ඒවායේ ස්වභාවය අනුව ස්ථාවර හෝ ජංගම වත්කම් ලෙස සුදුසු පරිදි අයිතිය භාර ගන්නා ආයතනය යටතේ ගිණුම්ගත කළ යුතු ය.

5.6. ව්‍යාපෘතිය යටතේ තෙවන පාර්ශ්වයන්ට ගෙවනු ලබන අත්තිකාරම් හා ආපසු ගෙවනු ලබන තැන්පතු (Refundable Deposits) ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙනම වත්කම් ලෙස පෙන්නුම් කළ යුතු ය.

5.7. ව්‍යාපෘතියේ සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් හා උපයෝගී බිල්පත් (විදුලිය, ජලය, දුරකථන වැනි) හා අනෙකුත් වගකීම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය.

5.8. ව්‍යාපෘතිය වෙනුවෙන් විවෘත කරන ලද සියලුම බැංකු ගිණුම්වල ශේෂයන් ශූන්‍ය කොට රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 6 ඡේදයෙහි උපදෙස් පරිදි භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇති **TOD/BA/03** ආකෘති පත්‍රය හා අනෙකුත් අදාළ ලියවිලි සමග අදාළ බැංකු ගිණුම් වසා දැමීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

5.9. ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ විශේෂ විදේශ ව්‍යවහාර ගිණුම් (Designated Accounts) විවෘත කර ඇත්නම් එම ගිණුම නිසි පරිදි සසඳා නිරවද්‍යතාවය තහවුරු කිරීමෙන් අනතුරුව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව හරහා අදාළ ගිණුම වසා දැමීමට කටයුතු කළ යුතු ය.

5.10. එමෙන්ම, ගිණුම් තුලනයේ දී යම් ශේෂයක් වේ නම් එම ශේෂය ණය ගිවිසුමේ විධිවිධාන ප්‍රකාරව නිරවුල් කිරීමට ද කටයුතු කළ යුතු ය.

5.11. රඳවාගැනීම් (Retention) බැංකු බැඳුම්කරයක් මත නිදහස් කිරීමට කටයුතු කළ යුතු ය. මෙහි දී මුළු නඩත්තු කාලයම ආවරණය වන පරිදි බැංකු ඇපකරයේ වලංගු කාලය නියම කළ යුතු ය.

5.12. ව්‍යාපෘතිය නිම වූ පසු සියලුම ගෙවීම්වලට අදාළ උපයෝගී ලේඛන, වාර්තා හා පොත්පත්, විධායක නියෝජිත ආයතනය වෙත පැවරිය යුතු ය.

5.13. ව්‍යාපෘතියේ නිශ්චය කර ගන්නා ලද අරමුණුවලට අනුකූලව ළඟා වී ඇති ප්‍රගතිය, මුහුණ දුන් අභියෝග හා උගත් පාඩම්, ඉදිරියේ දී ගත යුතු ක්‍රියාමාර්ග හා ව්‍යාපෘති තිරසාරභාවය ඇතුළත් සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තාවක් ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතු ය. එමෙන් ම මෙම අවසන් වාර්තාව සමග ව්‍යාපෘතිය නිම කිරීමට පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ වත්කම්වල ශේෂයන් හා සත්‍ය වශයෙන් පැවරූ ශේෂයන් අතර

සංසන්දනාත්මක ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු අතර එම අගයන් දෙක අතර වෙනසක් පවතී නම් ඒ සඳහා ප්‍රමාණවත් හේතූන් ද දැක්විය යුතු ය.

5.14. මූල්‍යායන ආයතනය විසින් නිකුත් කරනු ලබන ව්‍යාපෘති නිම කිරීමට අදාළ සමාලෝචන වාර්තාවෙහි පිටපතක් ව්‍යාපෘති ලිපි ගොනුවට ඇතුළත් කළ යුතු අතර එහි සඳහන් උගත් පාඩම් හා නිර්දේශයන් ඉදිරි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී විධායක නියෝජිත ආයතනය විසින් අවධානය යොමු කළ යුතු ය.

5.15. ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීම හා කාර්යසාධනය, සියලුම වත්කම් පැවරීම හා බැරකම් නිරවුල් කිරීම සහ ව්‍යාපෘති තිරසරභාවය තහවුරු කිරීමට ගෙන ඇති ඉදිරි වැඩ පිළිවෙල පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් අදාළ රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතු ය.

## 6. ව්‍යාපෘති අභ්‍යන්තර විගණනය

6.1. ජාතික විගණන පනතේ 40 (1) හා මු.රෙ.133 ප්‍රකාරව විධායක නියෝජිත ආයතන/ ක්‍රියාත්මක කිරීමේ ආයතනයන් සඳහා පත් කරනු ලැබ ඇති අභ්‍යන්තර විගණක විසින් ව්‍යාපෘති විගණන කටයුතු සිදු කළ යුතු ය. එමෙන්ම මු.රෙ.134 අනුව අභ්‍යන්තර විගණනයේ ස්වාධීනත්වය තහවුරු විය යුතු ය.

6.2. එමෙන්ම, ව්‍යාපෘති අභ්‍යන්තර විගණක පත් කිරීම සම්බන්ධයෙන් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කළ යුතු ය. ව්‍යාපෘති කළමනාකරණ ඒකකවල අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීම සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි කටයුතු කළ යුතු ය.

6.3. ඇමුණුම ii හි දක්වා ඇති ආකෘතිය ප්‍රකාරව ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශය සහිතව වර්ෂයේ පළමු ව්‍යාපෘති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී අනුමත කර ගැනීම කළ යුතු ය. එමෙන් ම ව්‍යාපෘති අභ්‍යන්තර විගණන කාර්තු වාර්තා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු ය.

6.4. ව්‍යාපෘති සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ ප්‍රධානත්වයෙන් වාර්ෂිකව පළමු හා තෙවන කාර්තු සඳහා ද ව්‍යාපෘති අධ්‍යක්ෂ ප්‍රධානත්වයෙන් දෙවන හා සිව්වන කාර්තු සඳහා ද වශයෙන් ව්‍යාපෘති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු ය. මෙහි ප්‍රධාන අරමුණ වනුයේ ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීම සඳහා සම්පත් කාර්යක්ෂමව හා සඵලදායී ලෙස ප්‍රශස්ත මට්ටමින් කළමනාකරණය කිරීමත්, වාර්තා වී ඇති ප්‍රගතිය සමාලෝචනය කිරීම තුළින් අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගත හැකි ද යන්න සොයා බැලීමත්, පවතින ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය තීරණ ගැනීමත් ය. ව්‍යාපෘති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වල සංයුතිය ඇමුණුම iii මගින් දක්වා ඇත.

6.5. සංවර්ධන ව්‍යාපෘති සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් ව්‍යාපෘතිය ආරම්භ කරන අවස්ථාවේ සිට පැවැත්විය යුතු අතර එහිදී පහත සඳහන් කාර්යයන් හි අත් කර ගෙන ඇති ප්‍රගතිය සත්‍ය වශයෙන්ම සිදු ව ඇති බවට සමාලෝචනය කළ යුතු ය.

- ව්‍යාපෘතියේ අපේක්ෂිත කාර්යසාධනය ළඟා කර ගෙන තිබේද? එසේ නොමැති නම් ඒ සඳහා බල පෑ හේතු පිළිබඳ වාර්තාවක් හා නිවැරදි කිරීම සඳහා යෝජනා සහිතව අදාළ අංශ වෙත ඉදිරිපත් කිරීම.
- ව්‍යාපෘතියට අදාළ අවදානම, ඒ සඳහා වන උපාය මාර්ගික සැලසුම් හා අවදානම අවම කිරීම සඳහා වන යෝජනා.
- ව්‍යාපෘතියට අදාළ සියලුම කොන්ත්‍රාත් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කටයුතු
- ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය ඇගයීමට ලක් කිරීම හා එයින් මතු වන අභ්‍යන්තර හා බාහිර විගණන නිරීක්ෂණ.
- ප්‍රාග්ධන වියදම්වල සමස්ත ප්‍රගතිය ඇගයීම, තිරසර සංවර්ධනයට දායකත්වය ඇගයීම, පසුවිපරම් කිරීම හා ප්‍රගතිය සමාලෝචනය කිරීම.
- ව්‍යාපෘති විෂය පථය වෙනස්වීමට අදාළ සමාලෝචනයන් සිදු කිරීම.
- විධිමත් අධීක්ෂණ හා ඇගයීම් ක්‍රමවේදයක් සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් හෝ තොරතුරු වාර්තාකරණ ක්‍රමවේදයක් ව්‍යාපෘතිය ආරම්භක අවධියේ දී ම ස්ථාපිත කර එහි ක්‍රියාත්මකභාවය ඇගයීමට ලක් කිරීම.
- නිම කරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් පාලනයක් හා නියාමනයක් ඇති කිරීම.
- නිශ්චිතව දක්වා නොමැති ව්‍යාපෘතියේ ප්‍රගතියට බලපාන අදාළ අනෙකුත් ආනුශාංගික කරුණු පරීක්ෂා කිරීම.

6.6. ව්‍යාපෘති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව, විගණකාධිපති සහ අදාළ අනෙකුත් ආයතන වෙත ඉදිරිපත් කළ යුතු ය.

6.7. නියමිත කාලය තුළ දී නිරවද්‍ය ව්‍යාපෘති ප්‍රගති වාර්තා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කරන්නේ ද යන්න සනාථ කර ගත යුතු ය.

6.8. අභ්‍යන්තර විගණක විසින් ව්‍යාපෘති වාර්ෂික කාර්යසාධනය පිළිබඳ වාර්තාවක් ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එම වාර්තාවෙ හි ව්‍යාපෘතියේ එක් එක් සංරචකවල අරමුණු ඉටු වී ඇති ආකාරය, විචලතා, උගත් පාඩම් හා පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමවේදවල දුර්වලතා හා ඒවා වළක්වා ගැනීම සඳහා වන අභ්‍යන්තර පාලන ක්‍රමවල සිදු කළ යුතු වැඩිදියුණු කිරීම සඳහා වන නිර්දේශ ද ඇතුළත් විය යුතු ය.

## 7. අදාළ චක්‍රලේඛ හා මාර්ගෝපදේශ

### 1. ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම, යෝජනා ඇගයීම, අනුමත කර ගැනීම හා ප්‍රගතිය ඇගයීමට අදාළ චක්‍රලේඛ

- ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුනතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක MNPEA/02/2019 හා 2019.01.10 දිනැති චක්‍රලේඛය.
- මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක MOFE&PD/ERD/2020/1 හා 2020.02.12 දිනැති චක්‍රලේඛය.
- විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අංක ERD/IRCPRS/GEN/10 හා 2020/02/17 දිනැති ලිපිය.
- ජනාධිපති ලේකම්ගේ අංක PS/EAD/Circular/16/2022 හා 2023.01.09 දිනැති චක්‍රලේඛය
- මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක MF/ERD/2023/02 හා 2023.03.24 දිනැති චක්‍රලේඛය.
- මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක MF/ERD/2023/01 හා 2023.03.27 දිනැති චක්‍රලේඛය.
- මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක 03/2023 හා 2023.06.16 දිනැති අයවැය චක්‍රලේඛය.
- කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති අංක 1/2024 හා 2024.06.21 දිනැති අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීමට අදාළ චක්‍රලේඛය.
- මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක 01/2024 හා 2024.01.12 දිනැති ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ චක්‍රලේඛය.

### 2. ව්‍යාපෘති මානව සම්පත් කළමනාකරණය

- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ.

**ඇමුණුම්**

i. ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් වන සංක්ෂිප්ත සටහන

ii. ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සැලැස්ම - ආකෘතිය

iii. ව්‍යාපෘති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සංයුතිය

ඇමුණුම i

## - ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලිය -

| අමාත්‍යාංශ කාර්යභාරය | අමාත්‍යාංශය හා බැඳුණු අනෙකුත් ආයතනවල හා පුද්ගලයින්ගේ කාර්යභාරය | |
|---|---|---|
| | ඉල්ලුම්පත්‍රය ඉල්ලුම්කාර අමාත්‍යාංශය මගින් ඉඩම් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම | |
| 2 වගන්තිය නියමය නිකුත් කිරීම | දැන්වීම් ප්‍රදර්ශනය කිරීම | ප්‍රාදේශීය ලේකම් |
| | ප්‍රගමන අනුරේඛනය සැකසීම | මිනින්දෝරු දෙපාර්තමේන්තුව |
| 4 වගන්තිය නියමය නිකුත් කිරීම | දැන්වීම් ප්‍රදර්ශණය කිරීම | ප්‍රාදේශීය ලේකම් |
| | විරෝධතා ඉදිරිපත් කිරීම | ඉඩමට අයිතිවාසිකම් කියන අය |
| | විරෝධතා පරීක්ෂණ පැවැත්වීම | ඉල්ලුම්කාර අමාත්‍යාංශය |
| 5 ප්‍රකාශය නිකුත් කිරීම | මූලික පිඹුර සැකසීම | මිනින්දෝරු දෙපාර්තමේන්තුව |
| 7 ගැසට් නිවේදනය හා පුවත්පත් දැන්වීම් පල කිරීම | වන්දි පරීක්ෂණ පැවැත්වීම | ප්‍රාදේශීය ලේකම් |
| | තක්සේරු වාර්තාව ලබාගැනීම | තක්සේරු දෙපාර්තමේන්තුව |
| | වන්දි ගෙවිය යුතු පුද්ගලයින් තීරණය කිරීම | ප්‍රාදේශීය ලේකම් |
| වන්දි හා පොලී ප්‍රතිපාදන මුදා හැරීම | වන්දි හා පොලී ගෙවීම | ප්‍රාදේශීය ලේකම් |
| 38 ආඥාව නිකුත් කිරීම | භුක්තිය භාර ගැනීම | ඉඩමේ අයිතිකරු |
| | භුක්තිය භාර ගැනීම/ භුක්තිය භාර දීම | ප්‍රාදේශීය ලේකම් |
| | භුක්තිය භාර ගැනීම | ඉල්ලුම්කාර අමාත්‍යාංශය |
| | රජයේ ඉඩමක් ලෙස ඉඩමේ අයිතිය ලියාපදිංචි කිරීම | ප්‍රාදේශීය ලේකම් |
| | ඉඩම සඳහා අත්කරගත් ආයතනය වෙත නීත්‍යානුකූල ලේඛන නිකුත් කිරීම | ප්‍රාදේශීය ලේකම් |

38 "අ" අතුරු විධාන ආඥාව නිකුත් කිරීම (2 වගන්තිය නියමයෙන් පසු සිට 7 ගැසට් නිවේදනයෙන් පසු දක්වා විකල්ප මාර්ගය)

ඇමුණුම ii

# ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සැලැස්ම 20……

**විධායක නියෝජිත ආයතනය** ……………………………………………………………………………………

**ක්‍රියාත්මක ආයතනය** ……………………………………………………………………………………

**ව්‍යාපෘතිය** ……………………………………………………………………………………

**මුළු ව්‍යාපෘති පිරිවැය (රු.මි.)** …………………

**වාර්ෂික ප්‍රතිපාදන (රු.මි)** …………………

| අනු අංකය | (02)<br>විගණන විෂයපථය | (03)<br>ව්‍යාපෘති විගණන ක්‍රියාකාරකම් | (04)<br>විගණන ක්‍රමවේදය | (05)<br>ව්‍යාපෘති අභ්‍යන්තර විගණන අරමුණු හෝ හඳුනාගන්නා ලද අවදානම් සාධක | (06)<br>අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම් කාලපරිච්ඡේදය | | | | | | | | | | | | (07)<br>නිකුත් කිරීමට අපේක්ෂිත විගණන වාර්තා ගණන | (08)<br>අවශ්‍ය මිනිස් දින ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | පළමු කාර්තුව | | | දෙවන කාර්තුව | | | තෙවන කාර්තුව | | | සිව්වන කාර්තුව | | | | |
| | | | | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | | |
| 1 | ව්‍යාපෘති ගිණුම්කරණය | i.<br>ii..<br>iii. | | | | | | | | | | | | | | | | |
| 2 | ව්‍යාපෘති ප්‍රසම්පාදනය | i.<br>ii..<br>iii. | | | | | | | | | | | | | | | | |
| 3 | ව්‍යාපෘති කොන්ත්‍රාත් පරිපාලනය | i.<br>ii..<br>iii. | | | | | | | | | | | | | | | | |
| 4 | ව්‍යාපෘති කාර්යසාධනය | i.<br>ii..<br>iii. | | | | | | | | | | | | | | | | |
| 5 | ව්‍යාපෘති වත්කම් කළමනාකරණය | i.<br>ii..<br>iii. | | | | | | | | | | | | | | | | |
| 6 | සාමාන්‍ය පරිපාලනය | i.<br>ii..<br>iii. | | | | | | | | | | | | | | | | |
| 7 | ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටු රැස්වීම් | i.<br>ii..<br>iii. | | | | | | | | | | | | | | | | |
| 8 | අර්ධ වාර්ෂික ව්‍යාපෘති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් | i.<br>ii..<br>iii. | | | | | | | | | | | | | | | | |
| 9 | විශේෂ විමර්ශන | i.<br>ii..<br>iii. | | | | | | | | | | | | | | | | |
| 10 | වෙනත් | i.<br>ii..<br>iii. | | | | | | | | | | | | | | | | |

**ව්‍යාපෘති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සංයුතිය**

- ***ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ ප්‍රධානත්වයෙන් වාර්ෂිකව පළමු හා තෙවන කාර්තුවල පැවැත්විය යුතු ව්‍යාපෘති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වල සංයුතිය***

| | |
|---|---|
| - අමාත්‍යාංශ ලේකම් | - සභාපති |
| - ප්‍රධාන මූල්‍ය නිලධාරී/අමාත්‍යාංශ ප්‍රධාන ගණකාධිකාරී | - සාමාජික |
| - කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ නියෝජිත | - සාමාජික |
| - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිත | - සාමාජික |
| - ජාතික විගණක කාර්යාලයේ නියෝජිත | - නිරීක්ෂක |
| - අමාත්‍යාංශ ප්‍රධාන අභ්‍යන්තර විගණක | - සාමාජික හා කැඳවුම්කරු |

- ***ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ ප්‍රධානත්වයෙන් වාර්ෂිකව දෙවන හා සිව්වන කාර්තුවල පැවැත්විය යුතු ව්‍යාපෘති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වල සංයුතිය***

| | |
|---|---|
| - ව්‍යාපෘති අධ්‍යක්ෂ | - සභාපති |
| - ව්‍යාපෘති ගණකාධිකාරී | - සාමාජික |
| - කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ නියෝජිත | - සාමාජික |
| - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිත | - සාමාජික |
| - ජාතික විගණන කාර්යාලයේ නියෝජිතයෙකු | - නිරීක්ෂක |
| - අභ්‍යන්තර විගණක | - සාමාජික හා කැඳවුම්කරු |